ද මැසිනොද් විදුහල, කඳාන

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

පළමු වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය

කාලය පැය $2\frac{1}{2}$

1.04.2016

Learning Resource Center R
Mazenod College Kandana

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

**දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

මලා තම ජීවනෝපාය ලෙස ගවුම්, කමිස, කලිසම්, සාය මසා ඇයගේම ව්‍යාපාර ස්ථානයේ තබා අලෙවි කරයි

1) මෙම ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
   1. ආහාර
   2. ඇඳුම්
   3. නිවාස
   4. සෞඛ්‍යය

2) මෙම ව්‍යාපාරය විසින් සපයනු ලබන ගවුම්, කමිස, කලිසම් යනාදිය හඳුන්වන්නේ
   1. නිෂ්පාදිත ලෙසය
   2. අවශ්‍යතා ලෙසය
   3. යෙදවුම් ලෙසය
   4. ප්‍රාග්ධනය ලෙසය

3) ඉහත සිද්ධිය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ

   A – මෙම ව්‍යාපාරය විවිධ මිනිස් වුවමනා නිර්මාණය කරයි

   B – මෙම ව්‍යාපාරය සේවා සැපයීමේ ව්‍යාපාරයකි

   C – මෙම ව්‍යාපාරය පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි

   D – මෙම ව්‍යාපාරය අසල පිහිටි එවැනිම ඇඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාර මෙම ව්‍යාපාරයට දුර්වලතාවයකි

   1. A හා B
   2. A හා C
   3. B හා C
   4. B හා D

4) ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කරනුයේ
   1. ලාභ ලැබීමේ අරමුණින් සිදුකරනු ලබන ඕනෑම ආර්ථික කටයුත්තකි
   2. පුද්ගලයින් දෙදෙනෙකු විසින් පවත්වාගෙන යනු ලබන ගිවිසුමකි
   3. මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි
   4. භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි

5) ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණක් හෝ උප අරමුණක් නොවන්නේ
   1. ලාභ ඉපයීම
   2. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
   3. සේවක සුභ සාධනය
   4. සමාජ සුභ සාධනය

6) පහත දැක්වෙන පිළිතුරු අතරින් අවශ්‍යතාවල ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වනුයේ
   1. අත්‍යවශ්‍ය වීම, පොදු වීම, නිර්මාණය කළ නොහැකි වීම
   2. අසීමිත වීම, අත්‍යවශ්‍ය වීම, පොදු වීම
   3. නිර්මාණය කළ හැකිවීම, අත්‍යවශ්‍ය වීම, විවිධ වීම
   4. සංකීර්ණ වීම, පොදු වීම, නිර්මාණය කළ නොහැකි වීම

7) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කළ හැකි ආකාරය වනුයේ
   1. පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු අංශයේ ව්‍යාපාර
   2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා සැපයීමේ ව්‍යාපාර
   3. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර
   4. මහා පරිමාණ ව්‍යාපාර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

8) නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය යන්නෙන් අදහස් වනුයේ
   1. නිෂ්පාදනයේදී යොදා ගන්නා ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත්
   2. ව්‍යාපාරය සඳහා යොදවන කායික හා මානසික දායකත්වය
   3. නිෂ්පාදනයේදී ආධාර කරගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ
   4. නිෂ්පාදනය අවශ්‍ය වන අනෙකුත් නිෂ්පාදන සාධක සංවිධානය කරමින් යන නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වාගෙන යාම

9) ව්‍යාපාරිකයෙකුට පහසුවෙන් පාලනය කළ හැකි පරිසරයකි
   1. නෛතික පරිසරය
   2. ආර්ථික පරිසරය
   3. අභ්‍යන්තර පරිසරය
   4. තාක්ෂණික පරිසරය

10) සේවක කුසලතා සංවර්ධනය සඳහා ව්‍යාපාරය විසින් පැවැත්වූ වැඩසටහන එහි සියලු සේවකයන් සාර්ථකව නිම කිරීම එම ව්‍යාපාරයට
   1. ශක්තියකි
   2. දුර්වලතාවයකි
   3. අවස්ථාවකි
   4. තර්ජනයකි

11) කර්මාන්ත ශාලාවක සේවකයන් එම කර්මාන්ත ශාලාවේ
   1. අවස්ථාවකි
   2. දුර්වලතාවයකි
   3. තර්ජනයකි
   4. ඇල්මැති පාර්ශවයකි

12) රටක මිල උද්ධමන අනුපාතිකය අයත් වන පරිසර සාධකය කුමක්ද?
   1. දේශපාලන පරිසරය
   2. නෛතික පරිසරය
   3. තාක්ෂණික පරිසරය
   4. ආර්ථික පරිසරය

13) පහත සඳහන් දෑ අතරින් ව්‍යාපාරයක් සඳහා බලපාන තර්ජනයක් නොවනුයේ
   1. ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම
   2. ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම
   3. තරගකරුවන් බිහිවීම
   4. ස්වභාවික ආපදා

14) කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම් වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ
   1. අරමුණක් තිබීම
   2. ආර්ථික කටයුත්තක නියැලීම
   3. නෛතික පුද්ගලභාවයන් පැවතීම
   4. නාමයක් තිබීම

15) මහ ජනයාට ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස්කරගත හැකි ව්‍යාපාර සංවිධානය වන්නේ
   1. සීමාසහිත සමාගම්
   2. හවුල් ව්‍යාපාර
   3. රාජ්‍ය සංස්ථා
   4. රාජ්‍ය සමාගම්

16) ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ

A – හවුල් ව්‍යාපාර
B – සීමිත සමාගම්
C – ඒක පුද්ගල ව්‍යාපාර
D – සමුපකාර
E – රාජ්‍ය සමාගම්
F – දෙපාර්තමේන්තු
G – රාජ්‍ය සංස්ථා

මේවා අතරින් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න
   1. A, D, E
   2. B, D, F
   3. C, F, G
   4. E, F, G

17) කමල් පෙරේරා තම තනි පුද්ගල ව්‍යාපාරය ' කමල් ස්ටෝර්ස් ' නමින් 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පණත යටතේ ලියාපදිංචි කර ඇත මේ තුළින් ඔහුගේ ව්‍යාපාරයට අත්කර ගත හැකි ප්‍රතිලාභයක් වන්නේ
   1. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
   2. ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම
   3. සියලු ලාභ තමා සතුකර ගතහැකිවීම
   4. ආදායම් බද්දෙන් නිදහස් වීම

18) යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු සාධකයක් නොවනුයේ

1. අරමුණ
2. පරිමාණය
3. හිමිකාරීත්වය
4. කළමනාකරණ කටයුතු සිදු කරනුයේ කවුරුන්ද යන්න

19) පහත සඳහන් ලක්ෂණ අතුරෙන් රාජ්‍ය සංස්ථා වල ලක්ෂණයක් නොවන්නේ

1. අයිතිය හා පාලනය රජය සතුවීම
2. නෛතික පුද්ගලභාවයක් තිබීම
3. අඛණ්ඩ පැවැත්මක් තිබීම
4. වගකීම් සීමිත වීම

20) පහත ව්‍යාපාර සංවිධාන අතරින් පොදු අංශයට අයත් ලාභ අරමුණු ඇති ව්‍යාපාර සංවිධානය වනුයේ.

1. රාජ්‍ය සමාගම
2. රාජ්‍ය සංස්ථාව
3. සංස්ථාපිත සමාගම
4. රාජ්‍ය දෙපාර්තමේන්තුව

## II කොටස

සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1) ශ්‍රී ලංකා තාක්ෂණික ආයතනයේ වඩු කාර්මික පාඨමාලාවක් හදාරා වසර දෙකකට ආසන්න කාලයක් දඹුලු ලී බඩු සමාගම් වඩු කාර්මික ශිල්පින් ලෙස සේවය කළ නාමල් හා අමල් යන මිතුරන් දෙදෙනා සිංහ ගෘහභාණ්ඩ නමින් ගෘහභාණ්ඩ නිර්මාණය කර විකිණිමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටියි ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා ඔවුන් දෙදෙනාම රු 100000 බැගින් ප්‍රාග්ධනය යෙදවීමට අපේක්ෂා කරන අතර කළමනාකරණ කටයුතු මිතුරන් දෙදෙනාගේම සහභාගිත්වයෙන් සිදුකිරීමට බලාපොරොත්තු වේ රජය විසින් නව ව්‍යාපාරකයන් සඳහා බදු සහන ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර තරගකරුවන් නොමැති ප්‍රදේශයක මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත

i. නාමල් හා අමල් විසින් ආරම්භ කිරීමට සුදුසු වනුයේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයක්ද?

ii.
 a) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අවශ්‍ය වේද?
 b) ඔබේ පිළිතුරට හේතු දක්වන්න

iii. හිමිකාරීත්වය අනුව වර්ග කරන විට මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය අයත්වනුයේ කුමන වර්ගයටද?

iv. අරමුණ අනුව වර්ග කරන විට මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය අයත් වනුයේ කුමන වර්ගයටද?

v. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි 2ක් හා අවාසි 2ක් ලියා දක්වන්න

vi. නාමල් හා අමල් අතර ලිඛිත ගිවිසුමක් පවත්වා ගත යුතුවේද ?

vii. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගයේ උපරිම සාමාජික සංඛයාව කීයද ?

viii. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහා බලපාන පණත කුමක්ද ?

ix. මෙහි දක්වා ඇති " කළමණාකරනය " යන්න නිර්වචනය කරන්න

x. මෙම ව්‍යාපාරය සඳහා බලපාන ශක්තීන් 2ක් හා අවස්ථාවන් 2ක් දක්වන්න

2)

i. අවශ්‍යතා හා වුවමනා යනු මොනවාදැයි උදාහරණ 2ක් සහිතව වෙන වෙනම නිර්වචනය කරන්න

ii. අවශ්‍යතා හා වුවමනා වල වෙනස්කම් 4ක් දක්වන්න

iii. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන නිෂ්පාදන සාධක කවරේද?

iv. ඉහත ( iii ) පිළිතුරේ සඳහන් නිෂ්පාදන සාධක නිර්වචනය කර දක්වන්න

v. ඇගළුම් කර්මාන්ත ශාලාවකට සම්බන්ධ ඇල්මැති පාර්ශව 4ක් දක්වන්න

vi. ඉහතින් සඳහන් කළ ඇල්මැති පාර්ශවයන් 2ක් ඇගළුම් කර්මාන්ත ශාලාවෙන් අපේක්ෂා කරන අරමුණු 2 බැගින් හා ඔවුන් මගින් කර්මාන්ත ශාලාව අපේක්ෂා කරන දායකත්ව 2 බැගින් දක්වන්න

3)

i. අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය යන්න නිර්වචනය කරන්න

ii. අභ්‍යන්තර පරිසරයේ සාධක 2ක් හා බාහිර පරිසරයේ ඇතුළත් සාධක 3ක් දක්වන්න

iii. පහත සඳහන් දෑ නිර්වචනය කරන්න
   a) පොලී අනුපාතය
   b) උද්ධමනය
   c) විදේශ විනිමය අනුපාතය
   d) ආදායම් ව්‍යාප්තිය

iv. පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද අසත්‍ය ද යන්න දක්වන්න
    අ) තොග වෙළඳ ආයතන සේවා සැපයීමේ ව්‍යාපාර සඳහා නිදසුනකි
   ආ) රජය විසින් අඩු පොලී ණය ක්‍රම හඳුන්වා දීම ව්‍යාපාරයක ශක්තියකි
   ඇ) ගණුදෙනුකරුවන් අභ්‍යන්තර පරිසර සාධකයකි
   ඈ) දේශිය පුහුණු ශ්‍රමය විදේශිය රටවලට ඇදී යාම දේශිය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමකි

v. තාක්ෂණික වෙනස් වීම නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම්වලට නිදසුන් 3 ක් දක්වන්න